# විදේශ විනිමය දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

# 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 05 දරන විධානයන්

---

## රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFAs) හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs) සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීම සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

### 1.1 සුදුසුකම්ලත් පුද්ගලයින්

සුදුසුකම්ලත් පුද්ගලයින් නියෝගයෙහි සඳහන් පරිදි විය යුතුය.

### 1.2 ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

නියෝගය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී ඇති අධිකාරිය ප්‍රකාරව, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමේදී, නියෝගයේ සඳහන් කර ඇති කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිද සැළකිල්ලට ගතයුතුය.

(අ) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්, ජංගම, ඉතිරිකිරීමේ හෝ කාලීන තැන්පතු ගිණුම් ලෙස විවෘත කර පවත්වාගෙන යාම සිදු කළ හැකිය.

(ආ) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වල අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් චෙක්පත් මගින් සිදු කළහැකිය. කෙසේවුවද, කිසිදු අවස්ථාවකදී රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් වලට බැංකු අයිරා පහසුකම් ලබා නොදිය යුතුය.

(ඇ) මෝටර් වාහන අලෙවියෙන් ලබාගත් මුදල් රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුමට බැර කිරීමේදී, බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම I හි දක්වා ඇති ලියවිලි ලබාගත යුතුය.

**1.3 රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සඳහා වූ අවසරලත් බැර කිරීම් සහ හර කිරීම්**

අවසරලත් බැර කිරීම් සහ හර කිරීම් නියෝගයන්හි දක්වා ඇති පරිදි වියයුතුය.

**1.4 රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සඳහා වූ අවසරලත් බැර කිරීම්**

නියෝගයන් මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරය ප්‍රකාරව, නියෝගයන්හි සඳහන් කර ඇති බැර කිරීම්වලට අමතරව, රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට පහත සඳහන් බැර කිරීම් සඳහා ද අවසර ඇත.

(අ) ගිණුම් හිමියා වෙනුවෙන් ශ්‍රී ලංකාවට පිටතින් ශ්‍රී ලංකා රුපියල්වලින් බැංකු පද්ධතිය හරහා ලැබෙන ප්‍රේෂණ

**1.5 රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම සඳහා වූ අවසරලත් හර කිරීම්.**

අවසරලත් හර කිරීම් නියෝගයේ සඳහන් පරිදි විය යුතුය.

**2. මෙම විධානයන්හි කාර්යය සඳහා**

(අ) "රාජ්‍ය තාන්ත්‍රික කාර්යාලය" යන්නෙන් තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, කොන්සල් කාර්යාල, එක්සත් ජාතීන්ගේ ස්ථිර කාර්යාල හෝ යුරෝපීය කොමිසමේ නියෝජිත මණ්ඩල යනාදිය අදහස් වේ.

(ආ) "රාජ්‍ය තාන්ත්‍රිකයන්" යන්නෙන් රාජ්‍ය තාන්ත්‍රික කාර්යාල විසින් නියෝජනය කරනු ලබන විදේශ රටක පුරවැසියන් අදහස් වේ.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

2017 නොවැම්බර් 20 වැනි දින

**2017 අංක 05 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I**

**මෝටර් වාහන අලෙවියෙන් ලබාගත් මුදල් රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුමට බැර කිරීමේදී ලබාගත යුතු ලියවිලි**

i. විකුණුම්කරුගේ නමින් වූ, මෝටර් වාහනයේ ලියාපදිංචි සහතිකය.

ii. මෝටර් වාහනයේ හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය - මෝටර් වාහනයේ හිමිකම ගැණුම්කරුට මාරු වූ බවට තහවුරු කිරීම සඳහා වූ ලේඛනමය සාක්ෂි

iii. ගැණුම්කරු විසින් නිකුත් කළ, මෝටර් වාහනයේ මිළ තහවුරු කිරීමේ ලිපියක්

iv. රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තීරුබදු තක්සේරු වාර්තාවක්

v. මෝටර් වාහනයේ හිමිකම පැවරීම සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශයෙන් ලබාගත් අවසර ලිපියක්

vi. ශ්‍රී ලංකා රේගුවෙන් ගණනය කරන ලද රේගු බදු සහ අනෙකුත් ගෙවීම්

vii. ශ්‍රී ලංකා රේගුවේ භාණ්ඩ ප්‍රකාශ කිරීමේ පත්‍රිකාව

viii. ශ්‍රී ලංකා රේගුවේ තක්සේරු නිවේදනය